ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**පුවත්පත් නිවේදනය**

**<u>ශ්‍රී ලංකා සිවිල් සේවා නිලධාරීන් සඳහා ඉන්දියාවේ පවත්වන ලද 10 වන ධාරිතා සංවර්ධන වැඩසටහන සාර්ථකව අවසන් වේ</u>**

ශ්‍රී ලංකා සිවිල් සේවා නිලධාරීන් 39 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් ඉන්දියාවේ යහපාලනය සඳහා ජාතික මධ්‍යස්ථානයේදී (NCGG) “ආපද කළමනාකරණය” යන මැයෙන් පැවති පුළුල් ධාරිතා සංවර්ධන වැඩසටහනක් 2026 ජූනි 05 වන දින සාර්ථකව අවසන් කළහ. ආපද සූදානම, ප්‍රතිචාර, යථා තත්ත්වයට පත්වීම සහ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සම්බන්ධයෙන් කටයුතු කරන ශ්‍රී ලංකා රජයේ නිලධාරීන්ගේ ධාරිතාවයන් ශක්තිමත් කිරීම මෙම වැඩසටහනේ අරමුණ විය.

2. ශ්‍රී ලංකා ජනාධිපති අතිගරු අනුර කුමාර දිසානායක මැතිතුමා විසින් 2024 වර්ෂයේදී සිදු කරන ලද ඉන්දීය සංචාරය අතරතුර යහපාලනය සඳහා ජාතික මධ්‍යස්ථානය සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලද අතර ඒ යටතේ වසර 5ක් පුරා ශ්‍රී ලංකා සිවිල් සේවා නිලධාරීන් 1500 දෙනෙකුට පුහුණුව ලබා දේ. මෙම වැඩසටහන සාර්ථකව අවසන් කිරීමත් සමඟ මේ දක්වා නිලධාරීන් 400 දෙනෙකුට පුහුණුව ලබා දී ඇත.

3. ආපද කළමනාකරණය සම්බන්ධයෙන් පැවති මෙම තෙවන වැඩසටහන දෙසතියක් පුරා පැවති අතර එහිදී නිලධාරීන්ට පුළුල්, අන්තර්ක්‍රියාකාරී පුහුණුවක් ලබා දෙන ලදී. විෂය මාලාව තුළින් ආපද කළමනකරණය සැලසුම් කිරීම සහ ප්‍රතිපත්ති, අවදානම් තක්සේරුව, ආපද සූදානම සහ හානි අවම කිරීමේ ක්‍රමවේදයන්, ප්‍රතිචාර යාන්ත්‍රණයන්, පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතීන්, ආපද අවදානම් සම්බන්ධ පාලනය, නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශයන්හි ඔරොත්තු දීමේ හැකියාව, දේශගුණික විපර්යාසයන්ට හැඩගැසීම, ජෛව විවිධත්වය සුරැකීම සහ අවදානම අඩු කිරීම සඳහා සෙන්දයි රාමුව ක්‍රියාත්මක කිරීම යනාදිය ආවරණය කරන ලදී.

4. ශ්‍රී ලංකා සිවිල් සේවා නිලධාරී කණ්ඩායම ජාතික ආපද කළමනාකරණ අධිකාරිය, ජාතික ආපද ප්‍රතිචාර බලකාය, උත්තරාකාන්ද ප්‍රාන්ත ආපද කළමනාකරණ අධිකාරිය, උත්තරාකන්ද ප්‍රාන්ත ආපද ප්‍රතිචාර බලකාය, PM ගති ශක්ති අත්හදා බැලීමේ

මධ්‍යස්ථානය, PM ගති ශක්ති අත්දැකීම් මධ්‍යස්ථානය සහ ප්‍රධාන් මන්ත්‍රී සංග්‍රාහලය යන ප්‍රමුඛ පෙළේ ආයතන වෙත ද ගියහ.

5. ධාරිතා සංවර්ධනය ශ්‍රී ලංකාව සමඟ ඉන්දියාවේ සංවර්ධන සහයෝගීතාවයේ වැදගත් අංගයකි. මෙම ක්ෂේත්‍රය තුළ ඉන්දියාවේ කැපවීම තවදුරටත් තහවුරු කරමින්, ඉන්දීය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා සිය 2025 ශ්‍රී ලංකා නිල සංචාරය අතරතුර දී වාර්ෂිකව ශ්‍රී ලංකා වෘත්තිකයන් සඳහා විශේෂයෙන් සකසන ලද අමතර පුහුණු අවස්ථා 700ක් ලබා දෙන බව නිවේදනය කළේය. මෙය ධාරිතා සංවර්ධන ප්‍රයත්නයන් සැලකිය යුතු ලෙස ශක්තිමත් කර අතර ඒ අනුව දැන් වාර්ෂිකව ශ්‍රී ලාංකිකයන් 1000කට පුහුණු අවස්ථා හිමි වේ.

***

*කොළඹ*
*2026 ජූනි 07*